සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ආර්ථික විද්‍යාව

සතිය - 12

ශ්‍රේණිය - 12

සකස් කළේ- කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

නිපුණතාව 2 - ඉල්ලුම,සැපයුම,නම්‍යතාව හා වෙළෙඳපොල සමතුලිතය සමතුලිතය විශ්ලේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.2 - ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම හා ඉල්ලුම වෙනස්වීම අතර වෙනස සංසන්දනය කරයි.

- **<u>ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම</u>** - සලකා බලන භාණ්ඩයේ මිල හැර අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී සලකා බලන භාන්ඩයේ මිල අඩු හෝ වැඩි වීමකට ප්‍රතිචාරීව එහි ඉල්ලුම් ප්‍රමාණය වැඩි හෝ අඩු වීමයි.
- **<u>ඉල්ලුම් සංකෝචනය</u>** - අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල වැඩි වුවහොත් එහි ඉල්ලුම් ප්‍රමාණය අඩු වන අතර එහි බලපෑම නිසා ඉල්ලුම් වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යය ඉහළට ගමන් කරයි.
- **<u>ඉල්ලුම් ප්‍රසාරණය</u>** - අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල අඩු වුවහොත් එහි ඉල්ලුම් ප්‍රමාණය වැඩි වන අතර එහි බලපෑම නිසා ඉල්ලුම් වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යය දිගේ පහළට ගමන් කරයි.

**<u>අභ්‍යාස</u>**

1.ඉල්ලුම වෙනස්වීම,ඉල්ලුම වැඩිවීම හා ඉල්ලුම අඩුවීම යන පද පැහැදිලි කරන්න.

2.භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම හා ඉල්ලුම වෙනස්වීම අතර වෙනස රූප සටහනකින් දක්වන්න.

3.ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීමට බලපාන හේතු මොනවාද?

4.ඉල්ලුම් වක්රය වමට විතැන් වීමට බලපාන හේතු මොනවාද?